# ගංගාවේ සංගීතය

❖ **පළමු තොටුපොළ**

සඳ පායපු රාත්‍රියක යාලුවෝ පිරිසක් චාරිකාවක් යනවා. පී. බී. කපිල, මාකඳුරේ ගුණේ, මීමන ප්‍රේමේ, බටුගෙදර, කුඩලිගම එකම සෙට් එකේ. කොළඹ II බෝට්ටුවෙන් මහ රෑ සීතලේ ෂෙලී ගඟ දිගේ යන මෙයාලා සුවඳ, දේදුන්න, මීවදය දුපත් පහු කරනවා. යන ගමන් කියවන්න ගෙනියනවා එකෝමත් එක රටක ඇ කුණාටුව සංවාදය. අහෝ ! බෝට්ටුව පෙරළිලා ඔවුන් වැටෙනවා ගඟට.

1. කතුවරයාගේ නම කුමක් ද?
2. අන්වර්ථ නාමය කුමක් ද?
3. සාහිත්‍ය යුගය කුමක් ද?
4. කුඩලිගමයන්ගේ සමකාලීන කවීහු කවුරුන් ද?
5. කුඩලිගමයන්ගේ වෙනත් නිර්මාණ මොනවා ද?
6. කුඩලිගම මහතා කවි ලියූ පුවත් පත් හා සඟරා නම් කරන්න
7. ගංගාවේ සංගීතය පාඩමෙහි ජීවන දෘෂ්ටිය කුමක් ද?

❖ **දෙවන තොටුපොළ**

අවුරුදු 15 හෝ 16 ක් පුරාවට ඔබත් ඔබගේ ජීවිතයේ විවිධ හැල හැප්පීම්වලට මුහුණ දෙන්න ඇති. දුවලා පුතාලා කතා කරන්න ඔයාලගේ හදවතට. අහන්න එයාගෙන් සතුට හෝ දුක දැනුණු අවස්ථා ගැන. ( එවැනි අවස්ථා 05ක් ලියන්න )

❖ **තෙවන තොටුපොළ**

ගංගාවේ සංගීතය පද්‍ය පන්තියේ රචනෝපක්‍රම

1. **භාෂා භාවිතය**
   - **උත්තම පුරුෂ ඒක වචන ආඛ්‍යාත පද සම්බන්ධ කරමින් ගංගාවත් ජීවිතයත් සැසඳීම**
     නිදසුන්- සැඟවෙමි එබෙමි නිසසල වෙමි සසල වෙමි
     ඇඹරෙමි එහෙත් පසු නොබසමි නොනවතිමි
   - **සංකල්ප රූප මැවීමට උචිත භාෂාවක් යොදා ගැනීම**
     නිදසුන් - උස්කඳුබිම්, සමතලා තැන්, ගල්පර, පෙණ පිඩු නංවන දිය, නිසසලව ගලන ගංගාව
   - **පොදුජන වහරින් සුපෝෂිත වූ කවි බස**
     නිදසුන් -
     - දං බෝවිටියා
     - සසල
     - මී අඹ
     - මල්පෙති
     - කිරල
     - තරුපිරිවරා
     - නිරසය
     - මහවන
     - අඩි සද්දෙන්
     - පණිවුඩය
2. **උචිත කවෝක්ති භාවිතය**
   - කලදෝ දියෙන් පොගවා රන් පුලින තලා
   - සංගීතවත් වී යම් ඉදිරියට ගලා
   - හමුවුණ කෙණෙහි මා සතු බර ඔහුට දෙමි
   - මී අඹ  කිරල මාදම් ගෙඩි ළදරු වියේ
   - ඇකයෙහි හෙළා හැඬවයි සැඩ සුළඟ රැයේ
   - හිරිමල් සිනා රළ පෙණ පිඩු මිහිරිතම
3. **අනුප්‍රාසාත්මක යෙදුම භාවිතය**
   නිදසුන්- හැපි හැපි / යන එන
4. **රූපක භාවිතය**
   නිදසුන්- ඉඳුනිල් ගැඹරු දියේ  / හිරිමල් සිනා රළි පෙළි පෙණ පිඩු
5. **එළිසමය භාවිතය**
   පද්‍ය පන්තිය පුරාම අග එළිසමය රැක ඇත.
6. **ජීවන දර්ශනය** ( ඔබ වටහා ගත් ආකාරයට ලියන්න )

❖ **අවසාන තොටුපොළ**

- සාහිත විමංසනය පොතපතට මතු නොව නුඹේ හෙට දවසම පිණිස බැව් දත යුතු.

මගේ දරුවනේ අසාපන්
මම ගඟක්
නුඹේ දිවිය හා සමපාත වුණු
කියාපන්
එකම එක වදනක්
උගත්තානම් නුඹේ දිවි

❖ **විමසනු පිණිස**

මලක
මෙළෙක මත
නිලමැස්සෙක්
මල් ශාලාවක ( ආරියවංශ රණවීර ඉමක් සහ මලක් )

අල්ලා බලන්න
මේ ගිලිහුණු
පියාපතෙහි
තවමත්
ගමනේ උණුසුම ( ආරියවංශ රණවීර තුන්පෙති සහ හතර පස් පෙති )